

ඇය රංගනයට, නර්තනයට උපන් හපන් දක්වන්තියක්. නව පරපුරේ කලාකාරිනියක් වන ඇය නමින් රංගි අප්සරා. මෙවර ලංකායූත් ඇයත් සමග සොඳුරු කතාබහකට එකතු වෙනවා.

# අයුතු යෝජනා ආවොත් මම ඒ දේවල් ප්‍රතික්ෂේප කළා

## RANGI APSASRA



✍ ස්ටෙෆනි කොතලාවල | පිටුසැකසුම Lankayouth.com

**රංගි ... මේ දවස්වල මොනවාද කරන්නේ ?**
මේ දවස් ටිකේ නම් කොරෝනා නිසා ගෙදර තමයි ඉන්නේ. ඊට අමතරව ආටිකල් ලියනවා. ඔන්ලයින් බිස්නස් වැඩ ටිකත් කරගෙන ඉන්නවා.

**රංගි කියන චරිතය මොන වගේ ද?**
අසාධාරණයක දී ගොඩක් නපුරුයි. නැත්නම් ඉතින් මම පාඩුවේ හිනාවෙලා ඉන්න කෙනෙක්.

**ඔබ කලාවට සම්බන්ධ වෙන්නේ කොහොමද?**
මුලින් ම දමයන්ති ෆොන්සේකා මිස් ළඟ රංගනය ඉගෙන ගන්න ගියා. ඊට පස්සේ නාලක විතානගේ අයියාගේ චිත්‍රපටයක රඟපෑවා. වෙළෙඳ දැන්වීම් කිහිපයකටත් ටෙලි නාට්‍ය කිහිපයකටත් රංගනයෙන් දායක වුණා. ඒ හරහා තමයි මම රංගනයට අවතීර්ණ වෙන්නේ.

**රඟපෑමේ දී චරිත තෝරා බේරා ගැනීමක් කරනවාද ?**
ඔව්... දැන් නම් රංගන කටයුතුවල යෙදෙන්නේ නැහැ .

**ඒ කියන්නේ රංගන කටයුතුවලින් සම්පූර්ණයෙන් ම අයින් වෙලා ද ?**
නැහැ... මියුසික් වීඩියෝවල රංගනයේ යෙදෙනවා.

**නර්තනයට ඇති කැමැත්ත මොන වගේද?**
ගොඩක් කැමතියි. මගේ ජීවිතය කිව්වොත් මම හරි. ඒ තරම් මම නර්තන කලාවට ගොඩක් ආදරෙයි.

**රංගි කියන්නේ කලාවේ විවිධ පැතිකඩවලින් දක්ෂකම් පෙන්වන කෙනෙක්..පොඩි කාලේ ඉදන්ම ද කලාවට කැමැත්තෙන් හිටියේ ?**
ඔව්. පෙර පාසල් යන කාලයේ ඉදන් ම.

**ක්ෂේත්‍රයේ ඉන්නකොට අයුතු යෝජනා එහෙම ඇවිත් තියේද..?**
ඔව්. මම ඒ දේවල් ප්‍රතික්ෂේප කළා.

**ලංකාවේ දැන් ඉන්න නව පරපුරේ කලාකරුවන් ගැන**



**ඔබ තෘප්තිමත් ද ?**
තෘප්තිමත් වෙන්න අමාරුයි.

**ක්ෂේත්‍රයට එන අලුත් අයට මොනවාද රංගිට කියන්න තියෙන්නේ ?**
"උත්සාහය, කැපවීම තියෙනවා නම් කරන්න බැරි දෙයක් නැහැ " කියලා.

**පවුලේ අයගෙන් කලා කටයුතුවලට ලැබෙන සහයෝගය මොන වගෙද?**
අම්මා තමයි මගේ ශක්තිය කිව්වොත් හරි.

**ඉදිරි බලාපොරොත්තු මොනවද? ඉදිරියේ දී නව නිර්මාණ තුළින් දැකගන්න හැකි වෙයිද ?**
නර්තනයෙන් ඉදිරියට යන්න තමයි බලාපොරොත්තු වෙන්නේ.

**අවසාන වශයෙන් මේ දක්වා ගමනේ දී ශක්තියක් වුණ අය ගැනත් මතක් කරමු.**
අම්මාගේ හයිය නැත්නම් අද මම මෙතන නැහැ. අම්මාව තමයි මුලින් ම මතක් කරන්න ඕනී. දමයන්ති මිස්, නාලක විතානගේ අයියා, මට උගන්වපු වචනයක් හරි කියලා දිරිමත් කරපු හැමෝමවත්, සචිත් අයියා, සමාධි හා තව නම් වශයෙන් කියන්න බැරි තරම් මගේ වටේ ශක්තියක් වෙලා ඉන්න හැමෝටම ගොඩක් ස්තූතියි.

මෙවැනි ලිපියක් ලංකායූත් වෙබ් අඩවියේ පළ කරගැනීමට ඔබත් කැමතිනම් 0718 548 549 වට්ස්ඇප් අංකයට කතා කරන්න.